ශීර්ෂය - 221 කම්කරු දෙපාර්තමේන්තුව
---------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

කම්කරු දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කම්කරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් ලෙස රු.103,609,362 ක් දක්වා තිබූ අතර එය රු.103,607,793 ක් විය යුතු වේ. ඒ අනුව වෙනස රු.1,569 කි. අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවිය යුතු විය. | මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය පිළියෙළ කිරීමේදී අත්තිකාරම් ගෙවීම් යටතේ 2020 වර්ෂයේ ස්ථාන මාරු වී පැමිණි නිලධාරියෙකුගේ රු.1,569 ක හිග ණය වාරිකයක් දෙවරක් සැලකිල්ලට ගැනීමෙන් මෙම වරද සිදුවී ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතුය. |

#### (ආ) තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2021 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂවලට බැර නොවී දෙපාර්තමේන්තු තැන්පත් ගිණුමෙහි පවතින සේවක අර්ථසාධක අරමුදල් ශේෂයන්හි වටිනාකම රු.301,779,837 ක් විය. | වසර 05 කට වඩා වැඩි කාලසීමාවක් ඇති තැන්පතු නිරවුල් වීම ඉතා මන්දගාමී තත්වයක පවතින අතර, අධිකරණ ක්‍රියාවලින් සඳහා යොමුවීමේදී අදාල සියළුම සේවකයන්ගේ නිවැරදි තොරතුරු ලබාගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන අතර, නව ශේෂ නිරවුල් කිරීමේදී වාරික අනුව නිරවුල් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත.කල් ඉකුත් වූ පොදු තැන්පත් රජයේ ආදායමට බැරකර ආපසු ගෙන්වා ගැනීමේදී අපහසුතාවයකට ලක්වන බැවින් හිමිකරුවන් හඳුනාගෙන නිරවුල් කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | පොදු තැන්පත් ගිණුමේ පවත්නා ශේෂ හඳුනාගෙන පුද්ගලික ගිණුම්වලට අප්‍රමාදව බැරකිරීමට කටයුතු කලයුතු වීම |
| (ii) | 2021 දෙසැම්බර් 31 දිනට ගිණුමෙහි ප්‍රතිලාභීන් වෙත ගෙවිය යුතු EPF නොවන මුදල්වල (C ගිණුම්හි) වටිනාකම රු.82,008,172 ක් විය. මේ තුල වන්දි ගෙවීම සඳහා අධිකරණ හා අධිකරණ නොවන මාර්ගයෙන් ලද රු.79,200,752 ක්ද, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය | අදාල අංශ වෙතින් හා පුද්ගලයින්ගෙන් මෙම මුදල් නිරවුල් කිරීම සඳහා රික්විසිෂන් පත්‍ර ඉදිරිපත් නොවීම නිසා මෙතෙක් එම මුදල් තැන්පත් ගිණුමේ රඳවා තබා ගැනීමට සිදුවී ඇත. | පොදු තැන්පත් ගිණුමේ පවත්නා හඳුනාගන්නා ලද ශේෂ අදාල ගිණුම්වලට අප්‍රමාදව බැරකිරීමට කටයුතු කලයුතු වීම |

කල යුතු රු.149,873 ක්ද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළයුතු රු.68,375 ක්ද, විවිධ පාර්ශවයන්ට ගෙවිය යුතු රු.2,589,172 ක්ද ඇතුලත්ව තිබුණි.

**(ඈ) දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනවල ACA-6 ප්‍රකාශයේ හා ACA-2(i) ප්‍රකාශය අතර 2021 වර්ෂය තුල කාර්යාල ගොඩනැගිලි, නොනිම් වැඩ වටිනාකම වෙනස රු.215,829,631 ක් වූ අතර එය ACA-6 ප්‍රකාශයේ ගිණුම්ගත වී නොතිබුණි | එම වටිනාකම අතර පවතින රු.215,829,631.00 ක් වූ වෙනසට හේතුව, එම වැය ශීර්ෂය යටතේ භාණ්ඩාගාර මුද්‍රිත මඟින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ඍජු හර හා ඍජු බැර කිරීම් වේ. | මූල්‍ය ප්‍රකාශ නිවැරදිව පිළියෙල කල යුතු අතර වගකිව යුතු නිලධාරීන් විසින් අධීක්ෂණය කළ යුතුය |
| (ii) | 221-2-4-2104 වැය ශීර්ෂය යටතේ මිලදී ගන්නා ලද රු.745,000 ක් වටිනා කාර්යාල උපකරණ ACA-6 ප්‍රකාශයේ ගොඩනැගිලි සහ ඉදිකිරීම් ලෙස දක්වා තිබුණි. | 221-2-4-2104 වැය ශීර්ෂය යටතේ සඳහන්ව ඇති රු.745,000 වටිනාකම, ගොඩනැගිල්ලට බෙදුම් ඇදි සවිකිරීම සඳහා කරන ලද වියදමක් බැවින් මෙය ACA – 6 ප්‍රකාශයේ ගොඩනැගිලි සහ ඉදිකිරීම් යටතේ වත්කම් ගිණුම් ගත කර ඇත. | මූල්‍ය ප්‍රකාශ නිවැරදිව පිළියෙල කල යුතු අතර වගකිව යුතු නිලධාරීන් විසින් අධීක්ෂණය කලයුතුය |
| (iii) | ACA-6 ප්‍රකාශයේ 2021 වර්ෂය සඳහා නොනිම් වැඩ ලෙස රු.338,726,860 ක් දක්වා තිබුණද 2021 වර්ෂය තුලදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබූ නිම නොවූ වැඩ වටිනාකම රු.384,203,502 ක් විය. ඒ අනුව රු.45,476,642 ක නොනිම් වැඩ අඩුවෙන් දක්වා තිබුණි. | රු.39,356,642 ක් වූ Residential Building හි සඳහන් Office Building යටතේ වත්කම් ගිණුම් ගත කර ඇත. වටිනාකම් WIP යටතේ ගිණුම්ගත විය යුතු බවට, හඳුනාගත් පසු 2022 අප්‍රේල් මස දී නිවැරදි කරන ලදී.<br>රු.6,652,435 ක් වූ කාර්යාල අළුත්වැඩියා වියදම් 2001 වැය ශීර්ෂය යටතේ සිදුකර ඇති බැවින් ACA-6 ප්‍රකාශයේ ඇතුළත් නොවේ.<br>ව.අ. 897 වටිනාකම රු.77,926,053 වුවත් එහි ගෙවීම් සිදු වී ඇති වටිනාකම රු.71,371,700 වේ. | මූල්‍ය ප්‍රකාශ නිවැරදිව පිළියෙල කල යුතු අතර වගකිව යුතු නිලධාරීන් විසින් අධීක්ෂණය කලයුතුය |
| (iv) | 2017 ජුනි 28 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අංක 01/2017වත්කම් කළමණාකරණ චක්‍රලේඛය පරිදි 2018 වර්ෂයේ සිට මිලදී ගන්නා හා අපහරණය කරනු ලබන සියලුම වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු අදාල කාර්තුව අවසානයේදී | ඉඩම්, ගොඩනැගිලි හා වාහන යන වත්කම් පිළිබඳ අදාළ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම පාලන අංශය විසින් සිදුකරනු ලබයි. යන්ත්‍ර හා කාර්යාල උපකරණ වත්කම් පිළිබඳ තොරතුරු ඉදිරියේදී යැවීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කලයුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | | |
| (v) | සමාලෝචිත වර්ෂය තුලදී අපහරණය කර තිබූ යන්ත්‍ර හා උපකරණවල අත්පත් කරගැනීම් පිරිවැය මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඉවත්කිරීම් යටතේ දැක්විය යුතු වුවත් විකුණුම් අගය වූ රු.2,480,673 ක් ACA-6 ප්‍රකාශයේ දක්වා තිබීමෙන් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් අධි ගණනය වී තිබුණි. | ACA – 6 ප්‍රකාශයේසඳහන් අපහරණය කරන ලද යන්ත්‍ර හා උපකරණවල රු.2,480,673 වටිනාකම විකුණුම් අගය නොවන බවත් එය වත්කමේ පිරිවැය අගය බවත් පසුව තහවුරු කර ගන්නා ලදී. | යන්ත්‍ර හා උපකරණවල අත්පත් කර ගැනීම් පිරිවැය වෙනුවට විකුණුම් අගය වූ රු.2,480,673 ගිණුම්වලින් ඉවත් කර ඇති බව ගණකාධිකාරී තහවුරු කර ඇති බැවින් වත්කම්වල පිරිවැය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කල යුතුය. |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට රු.710,278,354 ක් වූ තැන්පතු ශේෂයෙන් රු.470,736,369 ක් සඳහා උපලේඛණ හා තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | 2021 දෙසැම්බර් 31 දිනට සේ.අ.අ. නොවන (C) ශේෂ ලැයිස්තු ඇමුණුම 1 මගින්ද, දිස්ත්‍රික් කාර්යාල වල අදාල ශේෂ ලැයිස්තු ඇමුණුම 2 මගින්ද මේ සමඟ එවන අතර සේ. අ.අ. ගිණුමට අදාල ශේෂ ලැයිස්තු විද්‍යුත් තැපැල මගින්ද එවමි. | ගිණුම් ශේෂයන් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි මූල්‍ය ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කලයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03, 7.2 ඡේදය ප්‍රකාරව අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා දක්වා නොතිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි ලබාදී තිබූ ආකෘතිය(ACA-7) අනුව අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ 2020 වර්ෂයේ සංසන්දනාත්මක සංඛ්‍යා ඇතුලත් කිරීමට තීරුවක් වෙන් කර නොතිබූ නිසා මෙම අතපසු වීම සිදුවී ඇත. | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල විය යුතුය. |

**2.2 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයන් 3 කට අදාල රු.7,200,000 ක මුළු ප්‍රතිපාදනයම වියදම් අවම කිරීම සඳහා වූ 2021 අගෝස්තු 28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව වසා තිබූ අතර වැය විෂයන් 4 කට අදාල රු.4,400,000 ක් වූ ප්‍රතිපාදන 2021 වර්ෂය තුලදී සියයට 100 ක්ම උපයෝජනය කර නොතිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා විදේශීය ගමන් සිදු නොවීම, කාර්යාල වසා තැබීම, පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වීම හා 2021 අගෝස්තු 28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව වියදම් අවම කිරීම නිසා ප්‍රතිපාදන වැය කිරීමට නොහැකි වීම. | මු.රෙ.50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කික පදනමකින් හා නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කලයුතු වීම |
| (ආ) | 2021 අගෝස්තු 28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව වියදම් අවම කිරීම සඳහා වැඩසටහන 1 හි විෂයයන් වලින් රු.441,270,000 ක් වසා තිබූ අතර 2021 දෙසැම්බර් 31 වන විට වැය විෂයයන් 33 කට අදාලව සලසා තිබූ රු.1,417,295,319 ක ප්‍රතිපාදනයෙන් රු.1,011,083,360 ක් උපයෝජනය කර නොතිබුණු අතර එම නිසා ඇතිවන ඉතිරිවීම සියයට 50 සිට සියයට 98 ක පරාසයක විය. | කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා අපේක්ෂිත වියදම් දැරීමට නොහැකි වීම හා 2021.08.28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව වියදම් අවම කිරීම සඳහා වැඩසටහන 1හි විෂයන් වලින් රු.441,270,000ක් වසා තැබීම. | මු.රෙ.50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කික පදනමකින් හා නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කලයුතු වීම. |
| (ඇ) | 221-1-1-0-1404 වැය විෂයය සඳහා අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.33,000,000 ක් වූ අතර මුළු වියදම රු.74,334,386 ක් වී තිබුණි. මු.රෙ.66 යටතේ රු.41,334,500 ක් මාරු කිරීම් කර තිබූ අතර ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ඉක්මවූ වියදම සියයට 125 ක් විය. | මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ වරිපනම් ගාස්තුව ඇස්තමේන්තු අගයට වඩා ඉහල අගයක් ගැනීම හා දිස්ත්‍රික් කාර්යාල වල බදුකුලී ගිවිසුම් අළුත් කිරීමේදී ඉහල යාම මේ සඳහා හේතු වී ඇත. | මු.රෙ.50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කික පදනමකින් හා නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කලයුතු වීම |

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

බැරකම් හා බැදීම්වලට අදාළව අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත පරිදි වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශය අනුව බැරකම් ශේෂය රු.92,787,487 ක් වූ අතර එදිනට ගිණුම් ප්‍රකාශවල දක්වා තිබූ බැරකම් ශේෂය රු.13,301,690 | අප දෙපාර්තමේන්තුවේ කලාප කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල, උප කාර්යාල, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල හා අනෙකුත් අංශ වලින් අප වෙත වාර්තා | දෙපාර්තමේන්තුව විසින් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම විෂයයන්ට ඇති ගිණුම්වල නිවැරදි වටිනාකම මූල්‍ය |

| | | | |
|---|---|---|---|
| | කි. ඒ අනුව, රු.47,245,030 ක් වටිනා මුළු බැරකම් වටිනාකම ගිණුම්වලට ගෙන නොතිබුණු අතර රු.32,240,777 ක් වටිනා බැරකම් එක් එක් වැය විෂයයන්ට අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | කරන ලද ඇතැම් බැරකම් ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් නොකිරීමෙන් මෙවැනි වෙනස්කම් ඇති වී ඇත. | ප්‍රකාශනවල ඇතුලත් කලයුතු වීම |
| (ආ) | භාණ්ඩාගාර ප්‍රකාශයේ සටහන්ව තිබූ රු.24,562,247 ක්වූ බැඳීම් , බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | 2020 වර්ෂයේදීම මෙම බැරකම ගෙවා නිම කර ඇති අතර භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ හරහා බැරකම් නිරවුල් කිරීමක් සිදු නොකර ඇති බැවින් තවදුරටත් බැරකමක් ලෙස **SA-**92 හි සඳහන් වේ. එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | දෙපාර්තමේන්තුව විසින් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම විෂයයන්ට ඇති ගිණුම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කලයුතු වීම. |
| (ඇ) | වැය විෂයයන් 03 ක් යටතේ ගිණුම් ප්‍රකාශයේ දක්වා ඇති බැරකම් හා බැරකම් ලේඛනයේ වටිනාකම් අතර රු.119,218 ක වෙනසක් විය. | ගිණුම් ප්‍රකාශ සඳහා තොරතුරු ඇතුලත් කිරීමේදී ඇතිවූ ප්‍රමාද දෝෂයක් මත මෙම වරද විදුවී ඇත. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් අගයන් බැරකම් ප්රකාශනයේ නිවැරදිව සටහන් කලයුතුය. |

## 2.4 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත පරිදි වේ.

| | | **නිරීක්ෂණය** | | | |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| | | රු. | | | |
| (අ) | මු.රෙ. 208 | 397,410,290 | කම්කරු දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත් ආරම්භ කිරීමට පෙර මුළු මුදල ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට කටයුතු කිරීම හේතුවෙන් රු.397,410,290 ක් වියදම් නොවී වියදම් ලෙස ගිණුම්ගතවී තිබුණි. | ප්‍රසම්පාදන තීරණ, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉල්ලීම හා ඉංජිනේරු (සිවිල්)ගේ නිර්දේශය මත ඉදිකිරීම් වැඩිදියුණු කටයුතු සඳහා මුදල් නිදහස් කිරීම සිදුකර ඇත. | කළමණාකරණය විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛ | | | | |
| (i) | කම්කරු කොමසාරිස් | | සේවක අර්ථසාධක අරමුදලේ හිඟ දායක | හිඟදායක මුදල් අධිභාර මුදල් අයකර | හා දෙපාර්තමේන්-තුවේ අභ්‍යන්තර චක්‍රලේඛ |

| | | | | |
|---|---|---|---|---|
| | ජනරාල්ගේ 1999 පෙබරවාරි 11 දිනැති අංක 01/99 දරණ චක්‍රලේඛයේ 1.1, 1.1(3), 5.2 වගන්ති | මුදල් හා අධිභාර මුදල් අයකර ගැනීමේදී චක්‍රලේඛය ප්‍රකාරව සිදුකර නොතිබුණි. | ගැනීමේදී පරීක්ෂණ සිදුකිරීම්, ගණනය කිරීම් හා නිවේදන යොමුකිරීම් කටයුතු විධිමත්වපවත්වාගෙන යාම පිළිබඳව මේ වන විට නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් හට අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බැවින් මේ පිළිබඳව අවධානය යොමුකර ඇති බව කාරුණිකව සඳහන් කරමි. | ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | කම්කරු කොමසාරිස් ජනරාල්ගේ 2000 මැයි 08 දිනැති අංක 11/2000 දරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3(iii) හා 2(iii) | විවෘත වරෙන්තු නඩු සම්බන්ධ යාවත්කාලීන කරන ලද ලේඛණයක් පවත්වාගෙන යාම, ත්‍රෛමාසික වාර්තා නීති ක්‍රියා අංශයට ඉදිරිපත් කිරීම, විවෘත වරෙන්තු ක්‍රියාත්මක කිරීමට විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම යනාදිය සිදුකර නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට සංශෝධිත සමස්ථ අක්‍රිය නඩු සංඛ්‍යාව 4,393ක් සහ එහි මූල්‍ය වටිනාකම රු.2,162,338,383 ක් වන අතර 2021 දෙසැම්බර් 31 දිනට සංශෝධිත සමස්ථ විවෘත වරෙන්තු නඩු සංඛ්‍යාව 2,325ක් වන අතර එහි මූල්‍ය වටිනාකම රු.914,663,606 ක් විය යුතුය. | දෙපාර්තමේන්-තුවේ අභ්‍යන්තර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 4.3.1 (අ) | මුළු පිරිවැය ඇස්තමේන්තුව අස්ථිත්වය විසින් පිළියෙල කලයුතු වුවද අදාල ඇස්තමේන්තු කොන්ත්‍රාත්කරු වන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින්ම පිළියෙල කර තිබුණි. | ඉදිකිරීම් කාර්යයන්ට අදාලව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතින් ඇස්තමේන්තුව සකස් කර ගැනීම උපදේශන කාර්යයක් වශයෙන් පමණක් සිදුකරගන්නා අතර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ලංසු කැඳවා කොන්ත්‍රත්කරුවන් තෝරාගනු ලබයි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ-යන්ට අනුකූල විය යුතු වීම |
| (ඇ) | ගොඩනැගිලි වැඩ මැනීමේ සම්මත ක්‍රම - එස්එල්එස් 573 | ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා මැනීම් කටයුතු සිදුකර ගෙවීම් කටයුතු සිදුකල යුතු වුවද එම | අදාල මුළු මුදලම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවීම දෙපාර්තමේන්තු | ඉදිකිරීම් සඳහා ගෙවීම් කිරීමේදී ප්‍රමිතියට අනුකූලව කටයුතු කලයුතු |

| | | | |
|---|---|---|---|
| (SLS-573 - Sri Lanka Standards 573) | ප්‍රමිතියට අනුකූල නොවී එකවර මුළු මුදලම ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. | පරිචය වී තිබූ බැවින්ද, මුළු මුදලම ගෙවන ලදී. ඉදිරියේදී අත්තිකාරම් නිදහස් කිරීම මත ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | වීම. |

**2.5 අවිධිමත් ගණුදෙනු**

---------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ කුලී පදනම මත ලබාදුන් මහල් 13 ක ස්ථාපිත වර්ග අඩි 129,799 කට අදාලව කාර්යාල 5 ක් සමඟ 2022 මැයි 24 වන විටත් විධිමත් කුලී ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | සේවා නියුක්තිකයන් භාර අරමුදල් මණ්ඩලයට කුලී පදනම මත ලබාදී ඇති මහල් 5ක ගිවිසුම් අත්සන් කිරීමට සූදානම් කර ඇති අතර, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සමඟ විධිමත් ගිවිසුමට එළඹීම සඳහා එකඟතාවය ලබාගැනීම සඳහා යොමුකර ඇත.<br>ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව සමඟ වන විධිමත් ගිවිසුම සකස් කරමින් පවතී.<br>සේවක අර්ථසාධක අරමුදල් අංශය කම්කරු දෙපාර්තමේන්තුව යටතේම වන අංශයක් බැවින් ගිවිසුම් සකස් කර නැත.දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් බදු කුලී අයකර ගැනීමක් සිදුනොකරන අතර, විධිමත් පරිදි ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරමින් පවතී. | ගොඩනැගිලි කුලියට ලබාදීමේදී විධිමත් කුලී ගිවිසුම්වලට එළඹීමට කලමණාකාරීත්වය කටයුතු කළ යුතුය. |

**2.6 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

---------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දින වන විට නිලධාරීන්ගේ අය නොවූ ණය ශේෂයෙන් වර්ෂ 2 ත් 4 ත් අතර ශේෂය රු.781,108 ක් ද, වර්ෂ 5 ට වඩා වැඩි ශේෂය රු.1,186,675 ක් ද විය | රු.25,000 නොඉක්මවන ණය ශේෂයන්ගෙන් 196,494 ක ශේෂයන් කපා හැරීම සඳහා කම්කරු අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය සඳහා යවා ඇති අතර ලිපි ගොනු නොමැති වීම, ණය ශේෂයට වඩා වැඩි පිරිවැයක් නඩු පැවරීම තුලින් රජයට දැරීමට සිදුවීම නිසා නිලධාරීන්ගෙන් ශේෂයන් අය කර ගත නොහැකි වී ඇත. ඇතැම් ණය ශේෂ ඇපකරුවන්ගෙන් අය වෙමින් පවතින අතර අය වීමට ඇති ශේෂ | අප්‍රමාදව හිඟ ණය අයකර ගැනීමට කටයුතු කල යුතුය |

සම්බන්ධයෙන් නඩු පැවරීමේ කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි.

**2.7 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොදු තැන්පත් ගිණුම් 2 හි 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව වූ රු.710,278,354න් සියයට 62 ක් එනම් රු.443,591,355 ක් වූ අවුරුදු 2 ට වඩා වැඩි, කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571(2) හා (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වසර දෙක ඉක්මවූ තැන්පතු පිළිබදව මු.රෙ. 571 අනුව සිදු කිරිමට කටයුතු කර ඇති අතර, විවිධ හේතු නිසා මෙම මුදල් ගෙවීම ප්‍රමාද වී ඇත. රජයේ ආදායමට බැර කල ඉකුත් වූ පොදුතැන්පතු ආපසු ගෙන්වා ගැනීමේදි අපහසුතාවයට ලක්වන බැවින් මෙම මුදල් රජයේ ආදායමට බැර කිරිම ප්‍රමාද වී ඇත.<br>වසර දෙක ඉක්මවූ, රජයේ ආදායමට බැර කිරිම කළහැකි තැන්පතු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙනඇති බව කරුණිකව දන්වා සිටිමි. | පොදු තැන්පත් ගිණුමේ පවත්නා ශේෂ හදුනාගෙන අදාල ගිණුම්වලට අප්‍රමාදව බැරකිරීමට කටයුතු කලයුතු වීම හා ආදායමට බැරකල නොහැකි ශේෂ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන සටහන් මගින් හෙලිදරව් කල යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රතිලාභ නිසි ලෙස නොලැබීම සම්බන්ධයෙන් සේවකයන් වෙතින් කම්කරු කොමසාරිස් ජනරාල් වෙතට කරනු ලැබූ පැමිණිලිවලින් 2021 දෙසැම්බර් 31 දින වන විට විශේෂ විමර්ශන අංශය වෙත යොමු කළ 2015 සහ 2020 කාලයට අදාල විසඳා නොමැති පැමිණිලි සංඛ්‍යාව 96 ක් වූ අතර එය මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 31 ක් විය. | නොවිසඳුනු පැමිණිලි 128 අතුරින් පැමිණිලි 32 ක කටයුතු විසඳා අවසන් කර ඇති අතර විසඳා නොමැති පැමිණිලි සම්බන්ධයෙන්<br>පැමිණිලි පාර්ශවයන් පරික්ෂණ සඳහා ඉදිරිපත් නොවීම,කෝවිඩ්-19 වසංගතයේ හේතු මත පැමිණිලි පරීක්ෂණ අඩාල වීම,කම්කරු නිලධාරීන් ප්‍රමාණවත් නොවීම විසඳා නොමැති පැමිණිලි පැවතීමට හේතු විය. | පැමිණිලි විසඳීම් ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය. |
| (ආ) | 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ 27 වගන්තිය ප්‍රකාරව අනුමත කරන ලද පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල් පවත්වාගෙන යනු ලබන ආයතන සංඛ්‍යාව 2021 දෙසැම්බර් 31 දිනට 117 ක් විය. එදිනට ආයතන 30 ක අරමුදල්වල මුළු | කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇතැම් ප්‍රදේශ වශයෙන් ඇහුළු ලෑම, දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලය තුල ආසාදිතයින් වාර්තාවීම හේතුවෙන් දෙපාර්තමේන්තු කටයුතු ඇණහිටීම , පළාත් සංචරණ සීමා හේතුවෙන් කාර්යය මණ්ඩලයේ සැලකිය යුතු පිරිසක් සේවයට කැඳවීමට නොහැකි | පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල පිළිබඳ පනතේ වගන්ති සංශෝධනය කළ යුතු අතර එහි කටයුතු පිළිබඳ විධිමත් ක්‍රමවේදයන් ඇති කර නියාමනය කිරීම හා |

| | | | |
|---|---|---|---|
| | ශේෂ එකතුව රු.106,794,071,789 විය . එම අරමුදල් විධිමත් පරිදි නියාමනය කිරීමට අපොහොසත් වීමෙන් ලියාපදිංචි ආයතන සංඛ්‍යාව නිවැරදිව හඳුනා නොගැනීම, දායක මුදල් නොගෙවීමේ අවස්ථා හෙළිදරව් වීම හා අධිභාර ක්‍රියාත්මක නොවීම, එම ආයතනවල නිලධාරීන් විසින් වංචනික ලෙස මුදල් ලබාගැනීම, සේවායෝජක ආයතනවල ව්‍යවස්ථා ඉදිරිපත් නොවීම, පැමිණිලි විභාග කිරීමට ක්‍රියාත්මක නොවීම හා අරමුදලේ සාමාජික සංඛ්‍යාව, සක්‍රියව ක්‍රියාත්මක නොවන ආයතන/ අරමුදල්, 2021 දෙසැම්බර් 31 දිනට අරමුදල්වල ශේෂය හා හිඟ දායක මුදල් හඳුනා නොගැනීම, ආයතන පරීක්ෂා කිරීම පිළිබඳ විධිමත් තොරතුරු ඉදිරිපත් නොවීම, පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල් අංශයේ ප්‍රමාණවත් නිලධාරීන් මණ්ඩලයක් නොමැතිවීම හා පනතේ වගන්ති යාවත්කාලීන නොවීම හේතුවෙන් විවිධ අර්බුධ මතුවී මෙම අංශයේ කටයුතු අකර්මන්‍ය වී තිබුණි. | වීම, ඉතිරි කාර්යය මණ්ඩලය චක්‍රීය ක්‍රමයට කැඳවීම, පනවන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශ හේතුවෙන් බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කළ නොහැකි වීම ආදි හේතූන් මත පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදලට අයත් ආයතන සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු අපේක්ෂිත පරිදි ඉටුකිරීමට නොහැකි විය. එහෙත් මෙම අංශයේ රාජකාරී ඉටුකරනු ලබන සීමිත කාර්යය මණ්ඩලය යටතේ අදාල පරීක්ෂණ කටයුතු සිදුකිරීම හා වාර්තා යාවත්කාලීන කිරීම සිදුකරමින් පවතින අතර අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බාහිර ආයතන වෙතින් ප්‍රමාණවත් සහයෝගයක් නොලැබීම ද මෙම කටයුතු නිසි පරිදි ඉටුකිරීමට බාධාවක්ව ඇත. | අධීක්ෂණය කිරීම සිදු කල යුතු වීම |
| (ඇ) | විධිමත් නියාමනයක් නොමැතිවීම හේතුවෙන් පොල්වගා කිරීමේ මණ්ඩලයේ අනුමත සේවක අර්ථසාධක අරමුදලින් රු.73,839,369 ක් එහි නිලධාරීන් වංචා කර තිබූ අතර සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම නියමිත දිනට දායක මුදල් නොගෙවීම හේතුවෙන් 2019, 2020 සහ 2021 වර්ෂ තුන සඳහා රු.මිලියන 107 ක අධිභාර ගෙවිය යුතුව තිබුණි. | මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ කම්කරු කොමසාරිස් වෙත බලතල පවරා නොමැති අතර එම අරමුදල සේවක අර්ථසාධක අරමුදල වෙත පවරා ගැනීමේ කටයුතු කරමින් පවතී. සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම දායක මුදල් නොගෙවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර හිඟ දායක මුදල් හා අධිභාර ගණනය කිරීමටත් එම මුදල් අය කර ගැනීමටත් ඉදිරියේදී කටයුතු කරමින් පවතී . | පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල පිළිබඳ පනතේ වගන්ති සංශෝධනය කළ යුතු අතර එහි කටයුතු පිළිබඳ විධිමත් ක්‍රමවේදයන් ඇති කර නියාමනය කිරීම හා අධීක්ෂණය කිරීම සිදු කල යුතු වීම. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ කාර්යාල පිහිටුවා ඇති මහල්වලින් මහල් 20ක අභ්‍යන්තර නිර්මිත | මෙහෙවර පියස ගොඩනැගිල්ලේ බිම් මහල, 4, 5, 8, 9, 10, 11, 12, 13, 14, 28, 29, හා 30 යන මහල් වල | අභ්‍යන්තර නිර්මිත කටයුතු කඩිනමින් සිදුකර කාර්යාල කටයුතු |

| | | |
|---|---|---|
| කටයුතු හා පාටිෂන් කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි. මහල් 9 ක අභ්‍යන්තර නිර්මිත හා පාටිෂන් කටයුතු සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත 2021 දෙසැම්බර් 31 වන විට රු.460,326,053 ක් ගෙවා තිබුණද 2022 මාර්තු 02 දින වන විටත් එම කටයුතු ඉටුකර නොතිබුණි. | අභ්‍යන්තර නිර්මිත කටයුතු පමණක් කම්කරු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.<br>මේ වන විට 8, 9, 10, 11, 12, 13, 14 මහල් වල අභ්‍යන්තර නිර්මිත සකස් කරමින් පවතී. | ඵලදායී සහ විධිමත් ලෙස පවත්වා ගැනීමට කටයුතු කල යුතුය. |

**3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීම් කටයුතු සඳහා මුදල් ලබා දී එහෙත් වැඩ අවසන් නොවූ වැඩ වටිනාකම රු.13,120,430,059 ක් විය. | පිළිතුරු පසුව ඉදිරිපත් කරමි - ඉංජිනේරු (සිවිල්) | ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති කටයුතු කඩිනම් කර ඵලදායීව යොදා ගැනීම සිදුකල යුතුය. |

**3.4 ප්‍රසම්පාදනයන්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතින් ඉටුකර ගැනීම සඳහා 2021 වර්ෂය තුලදී රු.397,410,290 ක් වටිනා කොන්ත්‍රාත් 13 ක් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය. | | |
| (i) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3 පරිච්ඡේදය ප්‍රකාරව විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් භාවිත නොකර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ඍජුවම කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. | මු.රෙ. 787 අනුව රජයේ සියළුම නිර්මාණ හා වැඩ ක්‍රියාත්මක කිරීම පිලිබඳව වගකීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවතින බැවින් ඉදිකිරීම් කටයුතු එම දෙපාර්තමේන්තුව වෙතින් ඉටු කරවා ගැනීම. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කල යුතුය |
| (ii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුම් සහ 5.4.8 අනුව වූ කාර්යසාධන බැඳුම්කර විගණනයට ඉදිරිපත් නොවුණි. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් එම කාර්යය ඉටු කිරීම සඳහා තෝරා ගන්නා ලද කොන්ත්‍රාත් ආයතනය සමඟ ගිවිසුමට එළඹීමටත් ප්‍රතිග්‍රහණ ලිපිය අදාල ආයතනය වෙත නිකුත් කිරීමටත් කාර්යසාධන බැඳුම්කරය ලබා ගැනීමත් සිදු කරනු ලැබේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කල යුතු වීම |

| | | | |
|---|---|---|---|
| (iii) | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් උප කොන්ත්‍රාත්කරුවන් වෙත ඇස්තමේන්තු මුදලට වඩා අඩු වටිනාකමකට උප කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ලංසු කැඳවීමක් කර කොන්ත්‍රාත්කරුවකු තෝරාගන්නේ නම් අඩු පිරිවැයකට ඉටුකර ගැනීමට හැකිව තිබියදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත සෘජුවම කොන්ත්‍රාත් පිරිනැමීමෙන් අහිමි වූ මුදල රු.මිලියන 370.04 ක් විය. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ඉටු කරන ලද ඉදිකිරීම් හා අලුත්වැඩියාවන් වලදී කාර්යය ආරම්භ කිරීමට නම් අක්මුදල් ලබා දිය යුතුය. එම මුදල නිදහස් කළ පසු ඔවුන් උප කොන්ත්‍රාත් ආයතන වෙතින් පූර්ව කාර්යයන් ඉටු කිරීමට කටයුතු කරන බැවින් හා එම අවස්ථාවේ ප්‍රතිපාදන මෙන්ම මුදල් ද දෙපාර්තමේන්තුව සතුව පැවතුන බැවින් සම්පූර්ණ මුදලම නිදහස් කරන ලදී. | රජයේ මුදල් වියදම් දැරීමේදී නීතිරීති, රෙගුලාසිවලට අනුකූලව අවම පිරිවැයකින් වඩා ඵලදායීව යොදා ගැනීමට කළමණාකාරීත්වය කටයුතු කලයුතුය. |
| (iv) | ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී පාදක කරගත්, ලේඛණ (BSR, SSR) සහ වර්ෂය ඇස්තමේන්තුවල ඇතුලත් කර නොතිබුණි. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තුව පමණක් අප දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන බව දන්වමි. | පාදක කරගත් ලයිස්තු උපලේඛනය හා **(**BSR, SSR, HSR**)** සඳහන් කල යුතු අතර ඉංජිනේරු ඇස්තමේන්තුව හඳුනාගැනීම සඳහා යොදා ඇති කේත අංක යොදා පිළියෙල කල යුතුය |
| (v) | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සියයට 5 ක කළමනාකරණ ගාස්තුවක් ඇතුලත් කර ඇස්තමේන්තු අගයට වඩා අඩු අගයකට උප කොන්ත්‍රාත්කරුවෙකුට කොන්ත්‍රාත්තුව පිරිනමනු ලබයි. මුළු ඇස්තමේන්තු අගයම කාර්යයන් ආරම්භ කිරීමට ප්‍රථම ගෙවීම් කරන බැවින් වැඩි කොන්ත්‍රාත් වටිනාකමක් හා අමතර කළමනාකරණ ගාස්තුවක් දැරීමට සිදුවී තිබුණි. | පිලිතුරු පසුව ඉදිරිපත් කරමි - ඉංජිනේරු (සිවිල්). | රජයේ මුදල් වියදම් දැරීමේදී නීතිරීති, රෙගුලාසිවලට අනුකූලව අවම පිරිවැයකින් වඩා ඵලදායීව යොදා ගැනීමට කළමණාකාරීත්වය කටයුතු කල යුතුය |
| (ආ) | 'මෙහෙවර පියස' ගොඩනැගිල්ල ඉදිකරන ලද පෞද්ගලික ඉදිකිරීම් සමාගම සමඟ 2013 ඔක්තෝම්බර් 03 එළඹ තිබූ ගිවිසුමට අනුව මාස 36 කින් ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට එකඟ වී තිබූ නමුත් 2019 මාර්තු 27 දිනැති අංක අමප/19/0761/101/046 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් 2019 අප්‍රේල් 30 තෙක් ප්‍රමාද ගාස්තු | 2018 ජූනි 12 දිනැති අනුක්‍රමික අංක 15/2018 දරණ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ව්‍යාපෘතියේ ගිවිසුම් කොන්දේසි වලට අනුව ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු අයකර නොගැනීමට කටයුතු කර ඇත. අන්තර් ගෙවීම් සහතික 13ක් වෙනුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස ගෙවා | අදාල අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| ගෙවීමට යටත්ව කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර තිබුණි. එසේ වුවද 2021 දෙසැම්බර් 31 දින වන විටත් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.<br>2020 විගණන වාර්තාවේ දක්වා ඇති පරිදි අන්තර් ගෙවීම් සහතික (IPC) 13 ක් වෙනුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු.21,772,797 ක් අදාල පෞද්ගලික ඉදිකිරීම් සමාගමට 2020 වර්ෂයේදී ගෙවා තිබුණද කොන්ත්‍රාත්තුව ප්‍රමාදවීම සම්බන්ධයෙන් එම ආයතනයෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇති රු.21,772,797ක මුදල, අන්තර් ගෙවීම් සහතික වලට අදාලව මුදල් නිදහස් කිරීමේ ප්‍රමාදය මත ගෙවීම් සිදුකර ඇත. ප්‍රමාද ගාස්තු ගෙවීම ඉංජිනේරු සිවිල්ගේ CBM/Adm1/14/2017/8 හා 2021 ජූලි 07 දිනැති ලිපියට අනුව කොන්ත්‍රාත් ගිවිසුමේ Cl.57 ඡේදය අනුව ගෙවීම් කර ඇත. | |

**3.5 කළමණාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවක අර්ථසාධක අරමුදලේ හිමිකරුවන්ට ප්‍රතිලාභ නියමිත පරිදි ලබාදීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වලින් එකක් වුවද එයට බාධාවක් වනසේ සේවකයන්ගේ දායක ගිණුම්වලට බැර විය යුතු අර්ථසාධක අරමුදල්වලින් කොටසක් දීර්ඝ කාලයක් තිස්සේ විවිධ හේතුන් මත එම ගිණුම්වලට බැර නොවී කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන කම්කරු කොමසාරිස් ගිණුමට බැර කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ කම්කරු කොමසාරිස් ගිණුමේ ශේෂය රු.9,933,449,163 ක් වූ අතර 2021 සැප්තැම්බර් වන විට කම්කරු කොමසාරිස් දායක ගිණුමට බැරවී නිරවුල් නොවූ වසර 5 – 25 අතර පැරණි ශේෂය රු.4,583,817,783 ක් විය. | 2021 වර්ෂයේ කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් දිස්ත්‍රික් කාර්යාල වෙතින් අදාල තොරතුරු ගෙන්වා ගැනීමේ ප්‍රමාදයන් සිදු වූ අතර<br>කම්කරු කොමසාරිස් ගිණුම නිරවුල් කිරීමේ කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව හා සේවායෝජක පාර්ශවය යන ත්‍රෛපාර්ෂවික සහයෝගීතාවය මත සිදුවන කටයුත්තක් වන නමුත් සේවායෝජක පාර්ශවයෙන් ඒ සඳහා ප්‍රමාණවත් සහයෝගයක් නොලැබීම එම නිරවුල් කිරීමේ කටයුතු ප්‍රමාද වීම කෙරෙහි බලපාන බව සඳහන් කරමි.<br>එසේම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමුකළ "සී" වාර්තා ද මේ වන තෙක් නිරවුල් නොකර පැවතීම ද "කම්කරු කොමසාරිස්" ගිණුමේ ඇති ශේෂය විශාල වීමට හේතුවකි. | නිරවුල් නොවී පවතින දායක මුදල් නිරවුල් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම. |
| (ආ) | ශ්‍රී ලංකා මහ බැංකුවේ කම්කරු කොමසාරිස් ගිණුමෙහි පැවති ශේෂය නිරාකරණය කර ගැනීම | 2018 වර්ෂයේදී ආරම්භ කරන ලද රුපියල් මිලියන 10ට වැඩි දායක මුදල් ශේෂයන් සහිත | නිරවුල් නොවී පවතින දායක මුදල් නිරවුල් කිරීමට කඩිනම් |

| | | | |
|---|---|---|---|
| | සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 10 ට වඩා වැඩි අගයක් බැර වී තිබෙන ආයතනවල ගිණුම් නිවැරදි කර කේවල ගිණුම්වලට ගිණුම්ගත කිරීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබූ අතර මෙම ව්‍යාපෘතියෙන් ආයතන 23 කට අයත් රු.920,118,836 ක අරමුදලක් නිරවුල් කලයුතුව තිබුණි. 2021 සැප්තැම්බර් 07 දිනට අනුව මෙම ආයතන අතරින් කලාප 09 කට අයත් ආයතන 10 ක නිරවුල් කල යුතුව තිබූ රු.262,810,466 කින් රු.44,046,527 ක් පමණක් නිරවුල් කර තිබුණි. ඒ අනුව නිරවුල් නොවීමේ ප්‍රතිශතය සියයට 52 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවති අතර නිරවුල් නොවූ වටිනාකම රු.218,763,939 ක් වී තිබුණි. | සේවායායතනයන්ට අයත් ගිණුම් නිරවුල් කිරීමේ ව්‍යාපෘතියෙහි ප්‍රගතිය මගේ ඉහත 2022.03.27 දිනැති ලිපිය මඟින් ඔබ වෙත යොමුකල අතර 2021 වර්ෂය පුරාම පාහේ රට පුරා පැවති කොවිඩ් -19 වසංගතය හේතුවෙන් එම කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව කාරුණිකව සඳහන් කරමි. වර්තමානය වන විට එම නිරවුල් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බව ද වැඩිදුරටත් සඳහන් කරමි. | ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඇ) | පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ හිමිකම් ප්‍රතිලාභ නොලැබීම වෙනුවෙන් පවරන ලද නඩුවලින් 2021 දෙසැම්බර් 31 දින වන විට මුල්‍ය වටිනාකම රු.3,108,693,249 ක් වූ අක්‍රීය නඩු 5,151 ක් ද, මුල්‍ය වටිනාකම රු.879,249,210 ක් වූ විවෘත වරෙන්තු නඩු 2,822 ක් ද, විය. මෙම නඩු වර්ෂ 1 සිට 30 අතර කාලපරාසයක් තුල අක්‍රීයව පැවතුණි | 2021 දෙසැම්බර් 31 දිනට සංශෝධිත සමස්ථ අක්‍රීය නඩු සංඛ්‍යාව 4,393 ක් සහ එහි මූල්‍ය වටිනාකම රු.2,162,338,383 ක් වන අතර 2021 දෙසැම්බර් 31 දිනට සංශෝධිත සමස්ථ විවෘත වරෙන්තු නඩු සංඛ්‍යාව 2,325 ක් වන අතර එහි මූල්‍ය වටිනාකම රු.914,663,606 ක් විය යුතුය. එමෙන්ම සංශෝධිත දත්ත අනුව 2022 මාර්තු 31 දිනට සමස්ථ අක්‍රීය නඩු සංඛ්‍යාව 4,596 ක් වන අතර එහි මූල්‍ය වටිනාකම රු.1,738,630,576 ක් වන අතර සමස්ථ විවෘත වරෙන්තු 2,958 ක් වන අතර එහි මූල්‍ය වටිනාකම රු.642,956,437 ක් විය. | හිමිකම් ප්‍රතිලාභ ලබා ගැනීමට ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කර සේවා නියුක්තිකයන්ගේ හිමිකම් ලබාදීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | වසර 10 කට අධික කාලයක් පුරාවට නඩු මාර්ගයෙන් අයකර ගන්නා ලද කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණවලින් අයවී කේවල ගිණුම්වලට බැර නොවී තිබෙන EPF මුදල් වටිනාකම රු.127,700,262 ක් විය. අදාල ප්‍රතිලාභීන්ට ගෙවීම පිළිබඳ තොරතුරු ඇතුලත් කර නඩු | 2021 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදල විසින් බාහිර ආයතනවලට එරෙහිව අධිකරණවල පවරා ඇති නඩු සංඛ්‍යාව 12,535 ක් වන අතර එහි මූල්‍ය වටිනාකම රු.10,625,616,120 ක් විය. එමෙන්ම 2021 දෙසැම්බර් 31 දිනට බාහිර ආයතන විසින් අරමුදලට එරෙහිව අධිකරණවල පවරා ඇති නඩු | නිරවුල් නොවී පවතින දායක මුදල් නිරවුල් කිරීමට මහ බැංකුව සමඟ එක්ව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය . |

| | | | |
|---|---|---|---|
| | පැවරීමට පියවර ගෙන නොතිබීමෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටු නොවන අතර, කම්කරු අමාත්‍යාංශයේ දැක්ම කෙරෙහිද අහිතකර බලපෑමක් වී තිබුණි. | සංඛ්‍යාව 75 ක් වන අතර එහි මූල්‍ය වටිනාකම රු.233,966,799 ක් විය. | |
| (ඉ) | මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ ස්ථාපිත කාර්යාලවලින් ස්ථාපිත දිනයේ සිට 2021 දෙසැම්බර් 31 දක්වා රු.171,463,000 ක කුලී මුදල් හිඟව පැවතුණි. අවුරුදු 2 ට වැඩි කාලයක සිට නිශ්කාර්යව පවතින ඉඩකඩ ප්‍රමාණය වර්ග අඩි 102,725 ක් වන අතර එයින් වර්ග අඩි 39,180 ක මාසික තක්සේරු කුලිය රු.6,981,000 ක් විය. (4, 5, 28-31 මහල් හැර) ඒ අනුව 2021 වර්ෂය සඳහා රු.83,772,000 ක කුලී ආදායමක් අහිමි වී තිබුණි. | අදාල ආයතන මෙහෙවර පියස ගොඩනැගිල්ලේ ස්ථාපිත කල දිනයේ සිට අදාල බදු කුලී අය කිරීමට කටයුතු කර ඇත.<br>17 වන මහල රාජ්‍ය විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙන කර ඇත. | හිස්ව ඇති ඉඩකඩ තුල කාර්යාල ස්ථාපනය කිරීම කඩිනම් කිරීමටත්, කුලී පදනම මත ලබාදීමෙන් කුලී ආදායමක් ලබා ගැනීමටත් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඊ) | කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ භාවිතයට නොගන්නා ඉඩකඩ වර්ග අඩි 36,741 ක් මාස 10 සිට අවුරුදු 02 ක කාල පරාසයක සිට නිෂ්කාර්යව පවතින අතර 2021 වර්ෂය සඳහා රු.62,481,000 ක කුලී ආදායමක් අහිමි වී තිබුණි. බිම් මහලේ වර්ග අඩි 1,336 ක ස්ථාපිත කර තිබූ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙන් කුලී අයකර නොතිබූ අතර වර්ග අඩි 840 ක ස්ථාපිත කර තිබූ තැපැල් දෙපාර්තමේන්තුවෙන් මාසිකව රු.225 ක සුළු මුදලක් කුලිය ලෙස අයකර තිබුණි. | කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ 7 වන මහලේ 2020 සැප්තැම්බර් මස සිට 2021 අගෝස්තු මස දක්වා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය පවත්වා ගෙන යන ලදී.<br>2021 අගෝස්තු මස සිට එම මහල නිශ්කාර්යව පැවති අතර 2022 ජූලි 01 දින සිට එය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය සඳහා වෙන් කර ලබාදී ඇත. | හිස්ව ඇති ඉඩකඩ තුල කාර්යාල ස්ථාපනය කිරීම කඩිනම් කිරීමටත්, කුලී පදනම මත ලබාදීමෙන් කුලී ආදායමක් ලබා ගැනීමටත් ක්‍රියාමාර්ග ගැනීම. |
| (උ) | රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය නායයාම් තර්ජන පවතින බැවින් කුලී ගොඩනැගිල්ලක ස්ථාපිත කර රු.11,177,000 ක ඇස්තමේන්තු ගත මුදලකට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් අලුත්වැඩියා කර එහි ස්ථාපිත කිරීම සඳහා කටයුතු කර තිබුණි. | අළුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් අවධානම් තත්ත්වයක් නොමැති බව තහවුරු කරන ලද සහතිකයක් ලබාගෙන නොමැති<br>අතර සමීක්ෂණ වාර්තාවේ කෙටි කාලීන නිර්දේශ සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත දැනුම | අවධානම් ස්ථානවල ගොඩනැගිලි ඉදිකිරීමේදී/ අලුත්වැඩියා කිරීමේදී අදාල නීතිරීතීන්ට යටත්ව හා තත්ත්ව වාර්තා ලබාගෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම |

| | | | |
|---|---|---|---|
| | අලුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් ලබාගත් අවධානම් තත්ත්වයක් නොමැති බව තහවුරු කරන ලද සහතිකය හා කෙටිකාලීන නිර්දේශ ක්‍රියාත්මක කර තිබීම පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවුණි. | නොමැති බවත්, ඒ සඳහා විශේෂඥ දැනුම ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් ලබාගන්නා ලෙසත් දැනුම් දී ඇත. | සිදුකල යුතුය |
| (ඌ) | 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් නොවූ රු.77,067,802 ක් වූ ඉදිකිරීම් කාර්යයන් 17 ක් පිරිනැමීම සඳහා ප්‍රසම්පාදන කමිටු නිර්දේශ ලබාදී තිබුණි. 2018 ජනවාරි 01 සිට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පිරිනමා ඇති කොන්ත්‍රාත් සම්බන්ධ තොරතුරු 2022 මාර්තු 29 ඉල්ලීම් කර ඇතත් මේ දක්වා පිළිතුරු ඉදිරිපත් නොවුණි. | ඉදිකිරීම් කාර්යයන් එක් එක් අවස්ථාවලදී හඳුනාගන්නා ලද හා අදාල දිස්ත්‍රික් කාර්යාල වලින් ඉල්ලීම් කරන ලද අත්‍යවශ්‍ය කාර්යයන් වූ බැවින්ද 2021 ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී නිශ්චිතවම හඳුනා ගැනීමට නොහැකි වූ කාර්යයන් වනබව දන්වමි. | ප්‍රසම්පාදන සැලැස්ම නිවැරදිව සකස් කර ඒ අනුව කටයුතු කල යුතු අතර විගණනය විසින් ඉල්ලා ඇති තොරතුරු ගණන්දීමේ නිලධාරියා විසින් ඉදිරිපත් කල යුතුය. |
| (එ) | මූල්‍ය නොවන වත්කම්හි අයිතිය, පැවැත්ම, ප්‍රමාණය, වටිනාකම හා භාවිතය පිළිබඳව සනාථ කර ගැනීමට අවශ්‍ය තොරතුරු 2022 මාර්තු 15 දිනැති අංක LSW/B/LD/01/2022/INF21 දරණ ලිපියෙන් ඉල්ලා සිටියද එම තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු CIGAS වැඩසටහන තුල අන්තර්ගත වන අතර ස්ථාවර වත්කම් වර්ගය අනුව වටිනාකම් පිළිබඳව විස්තරාත්මක ලේඛණය පිටු 700කට පමණ අධික බැවින් මුද්‍රණය කිරීම අපහසු බැවින් මෘදු පිටපතක් ලබාදිය හැකිය. | ජාතික විගණන පනතේ 7 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති විසින් ඉල්ලුම් කරන ලද තොරතුරු ගණන්දීමේ නිලධාරී විසින් නිවැරදිව ඉදිරිපත් කල යුතුය. |

**4.** **යහපාලනය**

-----------------

**4.1** **අභ්‍යන්තර විගණනය**

-------------------------

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | ------------------------------- | ------------------------------------- | ----------------------- |
| (අ) | අභ්‍යන්තර විගණන පරීක්ෂණවලදී දෙපාර්තමේන්තුවේ කම්කරු කාර්යාලවල පවත්වාගෙන යනු ලබන පොදු සාක්ෂි ලේඛණය නිසි පරිදි අධීක්ෂණය නොකිරීම නිසා නිවේදන යැවීම, නඩු පැවරීම, පෙත්සම් සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීම සඳහා විශාල කාල ප්‍රමාදයන් සිදුවී තිබුණි. | අදාල කාල සීමාව තුලදී (2020 – 2021) රට තුල පැවති කෝවිඩ් - 19 තත්ත්වය හේතුවෙන් සියලුම කාර්ය මණ්ඩලය එකවර කැඳවීමත් සිදු නොකරන ලදී. එසේම අදාල කාලය තුලදී දිගටම පැවති සංචරණ සීමා හේතුවෙන් රාජකාරී කිරීමට දෙපාර්තමේන්තු සේවකයින්ට මෙන්ම පැමිණිලි මෙහෙයවීමට අවශ්‍ය සේවක, සේව්‍ය දෙපාර්ශවය ද එකවර කැඳවීම | අභ්‍යන්තර විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ අවධානය යොමු කර විධිමත් ක්‍රියා මාර්ග ගැනීම කළමණාකාරීත්වය විසින් සිදුකල යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | කලාප කම්කරු කාර්යාල 03 ක පරීක්ෂණ කටයුතු අවසන් නොවූ පෙත්සම් 503 ක් වූ අතර ප්‍රමාද වී ඇති කාල සීමාව දින 458 සිට දින 1146 පරාසයක විය. | ප්‍රායෝගිකව අපහසු විය. තවද නඩු පැවරීම සඳහා ද තැපැල් කටයුතු ද ඉහත කරුණු හේතුවෙන් අවහිර විය. | අභ්‍යන්තර විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ අවධානය යොමු කර ක්‍රියා මාර්ග ගැනීම කල යුතු වේ. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 3,121 ක් වුවත් තථ්‍ය සේවක සංඛ්‍යාව 2,593 ක් වූයෙන් පුරප්පාඩු 528 ක් පැවතුණි. | 2021 දෙසැම්බර් 31 වන දිනට පුරප්පාඩු 528ක් පැවතියද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, රාජ්‍ය කළමනාකරණ සේවයේ පවතින පුරප්පාඩු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් පිරවිය යුතු අතර දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගේ පුරප්පාඩු දෙපාර්තමේන්තුව විසින් පුරවනු ලැබේ. | දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත කාර්යභාරය වඩාත් කාර්යක්ෂමව ක්‍රියාවේ යෙදවීමට හැකි ලෙස මානව සම්පත ප්‍රශස්ථ හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට කටයුතු කලයුතුය. |